සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය – 13 ශ්‍රේණිය – 2023
Third Term Test - Grade 13 - 2023

# සංගීතය (පෙරදිග) – I

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා ගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
iii. 26 සිට 50 දක්වා ප්‍රශ්න වලට එම හිස්තැනෙහිම පිළිතුරු ලියන්න.

---

01. රාගධාරී ශාස්ත්‍රීය සංගීතය හදාරන ආධුනිකයෙකු මුලින්ම සිදුකළ යුතු අභ්‍යාසය වන්නේ,
(1) රාග අභ්‍යාසයි (2) තාල අභ්‍යාසයි (3) ආලාප අභ්‍යාසයි
(4) ස්වර අභ්‍යාසයි (5) තාන අභ්‍යාසයි (.........)

02. තිලක්කාමෝද් රාගය අයත් වන මේල ස්වර වන්නේ,
(1) සරිගමපධනි (2) සරිගමපධනි (3) සරිගමපධනි
(4) සරිගමපධනි (5) සරිගමපධනි (.........)

03. ස ග, මපධප ලෙස ස්වර යෙදෙන රාගය මින් කුමක්ද?
(1) හංස ධ්වනි (2) කාලිංගඩා (3) ජයජයවන්ති
(4) භෛරව (5) දේශ් (.........)

04. සමප්‍රකෘති රාග යුගලයක් සහිත වරණය තෝරන්න.
(1) දේස් - ආසාවරී (2) ජෞනපූරි - කාලිංගඩා
(3) හංස ධ්වනි - ජයජයවන්ති (4) කාලිංගඩා - ආසාවරී
(5) ආසාවරී - ජෞනපූරි (.........)

05. ගාන්ධාරය දෙ ආකාරයෙන් ම යෙදෙන රාත්‍රි දෙවන ප්‍රහරයේ ගැයෙන රාගය තෝරන්න.
(1) දේස් (2) ජයජයවන්ති (3) භෛරව (4) බාගේශ්‍රී
(5) හංසධ්වනි (.........)

06. පහත සඳහන් රාග යුගල අතරින් ''මුව මුක්තලතා'' හා ''හෝපලු වන පෙත'' යන ගීත දෙකට පදනම් වූ රාග යුගලය ඇතුළත් පිළිතුර තෝරන්න,
(1) මාල්කෞන්ස් හා බාගේශ්‍රී (2) හංසධ්වනි හා පීලු
(3) පීලු හා දේස් (4) බාගේශ්‍රී හා පීලු
(5) මාල්කෞන්ස් හා පීලු (.........)

07. පහත සඳහන් සංගීත සම්ප්‍රදායන්ගෙන් ඒක ස්වර (Melody) හා බහු ස්වර (Harmony) යන සංකල්ප දෙකට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න,
(1) පෙරදිග හා කර්ණාටක (2) පෙරදිග හා අපරදිග
(3) අපරදිග හා කර්ණාටක (4) පෙරදිග හා දේශීය
(5) කර්ණාටක හා දේශීය (.........)

08. සනි ධනි සම ගම ධම ගම ගරි ස- යන තානාලංකාරය අයත් රාගයේ සඳහන් පිළිතුර තෝරන්න.
(1) මේලය ආසාවරී වේ (2) විවාදී ස්වරයක් ලෙස පංචමය යොදා ගනී
(3) ග, ධ වාදි සංවාදි වේ (4) සමප්‍රකෘති රාගය ජෞනපූරි වේ
(5) ගානසමය රාත්‍රී දෙවන ප්‍රහරය වේ. (.........)

09. දේශීය සිනමා ඉතිහාසයේ පළමු දශකය ලෙස සලකන්නේ මින් කුමන වර්ෂයන්ද?
(1) 1937 - 1947 (2) 1947 - 1957 (3) 1950 - 1960 (4) 1957 - 1967
(5) 1967 - 1977 (.........)

10. මධ්‍යමය සහ ධෛවතය යන (ම, ධ) ස්වර දෙකම වර්ජිත නිර්දේශිත රාගය තෝරන්න.

(1) දේස් (2) හංසධ්වනි (3) ආශාවරී (4) බාගේශ්‍රී
(5) භෛරවි (.........)

11. වීනාව, සරෝද්, සිතාර්, සහ වයලීනය වැනි සංගීත භාණ්ඩ වලින් වැයෙන තානාලංකාර හඳුන්වන තවත් නමක් ඇතුළත් පිළිතුර තෝරන්න,

(1) සපට්තාන් (2) ශුද්ධතාන් (3) කූටතාන් (4) තෝඩා
(5) ගමක්තාන් (.........)

12. රාග ගායනයේදී ක්ෂණිකව නිර්මාණාත්මකව ගොඩනගා ගන්නා නාද විග්‍රහ හඳුන්වන නම කුමක් ද?

(1) ගමක් (2) මීන්ඩ් (3) උපජ් (4) ආන්දෝලන
(5) බන් (.........)

13. අංග හතරකින් සමන්විත හින්දුස්ථානි ගායන ශෛලිය තෝරන්න,

(1) ගසල් (2) ඨුම්රි (3) භජන් (4) කව්වාලි
(5) චතුරංග (.........)

14. ශාස්ත්‍රීය තබ්ලා වාදනයකදී යොදා නොගන්නා ශිල්පාංගය ඇතුළත් වරණය තෝරන්න.

(1) පල්ටා (2) තිහායි (3) ජලා (4) මුකුඩා
(5) චක්‍රදාර් (.........)

15. ''ගීතං වාද්‍යං තථා නෘතත්‍යං - ත්‍රයං සංගීත මුඛ්‍යතේ'' යන ශ්ලෝක පාඨය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(1) සංගීත රත්නාකරයයි (2) ගීත ගෝවින්දයයි
(3) සංගීත පරිජාත ය (4) සංගීත සංහිතා ය
(5) බෘහද්දේසි ය (.........)

16. මෙහෙ ගී ගණයට අයත්වන ගී සමූහය ඇතුළත් පිළිතුර තෝරන්න,

(1) පාරු ගී, ප්‍රශස්ති ගී, පතල් ගී, ගැල් ගී, ගොයම් ගී
(2) ප්‍රශස්ති ගී, වන්නම් ගී, පතල් ගී, ගොයම් ගී
(3) බඹර ගී, ගොයම් ගී, පැල් ගී, පතල් ගී, ප්‍රශස්ති ගී
(4) ගොයම් ගී, පතල් ගී, ගැල් ගී, පාරු ගී, බඹර ගී
(5) බඹර ගී, නෙළුම් ගී, ප්‍රශස්ති ගී, පාරු ගී, හටන් ගී (.........)

17. කෝමල රිෂභය හා කෝමල ධෛවතය සමඟ ශුද්ධ මධ්‍යමය යෙදෙන රාගයක් ගැයීමට සුදුසු කාලය වන්නේ,

(1) දිවා ප්‍රථම ප්‍රහරයයි (2) මධ්‍යම රාත්‍රියයි
(3) උදය සන්ධි ප්‍රකාශ සමය යි (4) සවස සන්ධි ප්‍රකාශ සමය යි
(5) රාත්‍රී දෙවන ප්‍රහරයයි (.........)

18. ''උරුට්ටුව'', ''කෝඩයම'' සහ ''පොතේ සින්දුව'' යන ශිල්පාංග ඇතුළත් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලිය කුමක්ද?

(1) සොකරි (2) කෝලම් (3) නූර්ති (4) නාඩගම්
(5) නව නාට්‍ය (.........)

19. කර්ණේන්ද්‍රිය තුළ ඇතුළත් නොවන අවයවය මින් කුමක්ද?

(1) මුද්ගරිකා අස්ථිකාව
(2) යුස්ටේකීය නාලය
(3) වෙස්ටිබියුලර් තන්තු
(4) වෙස්ටිබියුලර් ස්නායුව
(5) කර්ණශංකය (.........)

20. මූර්කි ස්වරයක් සංකේතවත් වන පිළිතුර තෝරන්න,

(1) ස ම (2) <u>ග</u><u>ග</u>රිස (3) (ම) (4) $^{\text{නි}}$ධ
(5) <u>ග</u> (.........)

- **පහත සඳහන් ගී පාද ඇසුරෙන් අංක 21 සිට 26 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A ලක්ෂ්මී බුජ වාසා
B සූරිඳුන් පෙර සිටන්
C අකුලා ගෙන සොඬ
D පුරණ සමුදුර දුවන නැව්
E ගුණ දැනේ බෝසත් අනේ පෙර

21. කවිකාර මඩුව ආශ්‍රිතව ගොඩ නැගුන ගී වර්ග දෙකට අයත් ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න,
(1) E හා A (2) B හා C (3) A හා D (4) C හා D
(5) E හා D (.........)

22. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ගී පාදය අයත් ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද?,
(1) D (2) E (3) A (4) B
(5) C (.........)

23. C අක්ෂරයෙන් දැක්වෙන ගී පාදය අයත් වනුයේ,
(1) ප්‍රශස්ති ගී ගණයටය (2) සවුදම් වලටය
(3) උඩරට වන්නම් ගී ගණයටය (4) හටන් ගී වලටය
(5) නාඩගම් ගී වලටය (.........)

24. B අක්ෂරයට හිමි ගීතය ගැයෙන තිත වන්නේ මින් කුමක්ද?
(1) මහ තනි තිතටය (2) සුළු මැදුම් දෙතිතටය
(3) මැදුම් තනි තිතටය (4) මැදුම් මහ දෙතිතටය
(5) සුළු මහ දෙතිතටය (.........)

25. මැදුම් මහ දෙතිතට ගැයෙන ගීත අයත් ඉංග්‍රීසි අක්ෂර ඇතුළත් පිළිතුර තෝරන්න,
(1) A හා B (2) C හා A (3) D හා E (4) E හා A
(5) D හා B (.........)

26. ඩබල් රීඩ් (*Double Reed*) සහ (*Single Reed*) සිංගල් රීඩ් ගණයට අයත් වන සංගීත භාණ්ඩ යුගලයක් තෝරන්න.
(1) ඕබෝ සහ ඉයුෆෝනියම් (2) ක්ලැරිනට් සහ ඕබෝ
(3) ට්‍රම්පට් සහ ක්ලැරිනට් (4) ඉවුෆෝනියම් සහ ට්‍රම්පට්
(5) ටියුබා සහ ඕබෝ (.........)

27. ග - ස -/ රි - - ම/ග - පනි/ස̇ - - -/ මෙම ස්වර පාදයට වඩාත්ම සුදුසු කෝඩ් (*Chord*) ඇතුළත් වරණය තෝරන්න.
(1) $C^m / G / B^b / F^m$ (2) $C^m / B^b / C / C$ (3) $C^m / D / G / C^m$ (4) $C^m / F^m / B^b / G^m$
(5) $C^m / B^b / E^b / C^m$ (.........)

28. ගීතවල වචන හා නාද මාලාවන්, සිදු කරන කාර්යටම බද්ධව නිර්මාණය වී ඇති ගැමි ගීත විශේෂය තෝරන්න,
(1) කෙළි ගී (2) මෙහෙ ගී (3) වැළපුම් ගී (4) ශාන්ති කර්ම ගී
(5) වන්නම් (.........)

29. ආලාප ගායනයේ දී, ඛ්‍යාල් ගීතයේ වචන උපයෝගී කරගනිමින් සිදු කරනු ලබන ගායනය,
(1) නෝම් තෝම් ආලාප වේ. (2) පූර්ව ආලාප වේ.
(3) බෝල් ආලාප වේ. (4) සර්ගම් ආලාප වේ.
(5) ආකාර් ආලාප වේ. (.........)

30. බටහිර සංධ්වනි ආකෘතිය අනුගමනය කරමින් දේශීයව ගොඩනැගුන නිර්මාණ දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මානසවිල සහ පිරිනිවන් මංගල්‍යය (2) පන්සිළු සහ වැස්ස
(3) ගොයම් දා මගුල සහ මාර පරාජය (4) මාර පරාජය සහ අග්නි
(5) මගේ කාලයේ මව්නි සහ මාර පරාජය (.........)

31. ජාවා සහ සුමත්‍රා යන දූපත් වලින් බිහිවූයේ ...................................... සංගීතයයි. ඉස්ලාමීය සංගීතය බිහි වූයේ .......................................... රටවලිනි.

32. 1974 වර්ෂයේ මුද්‍රණය වූ ''ලංකාවේ සංගීත සම්භවය'' ග්‍රන්ථය රචනා කරන ලද්දේ ...................................... මහතා වන අතර ''හෙළ ගී මග'' ......................................................... මහතා විසින් රචිත කෘතියකි.

33. කර්ණාටක සංගීත ආභාෂයෙන් ...................................... රංග සම්ප්‍රදාය ද .......................................... රංග සම්ප්‍රදාය හින්දුස්ථානි සංගීතයේ ආභාෂයෙන් ද නිර්මාණය වී ඇත.

34. සිංහල ගීතයක් කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රථමවරට යොදා ගත් සංගීත කණ්ඩායමේ නම .......................... වන අතර එම කණ්ඩායමේ නායකයා ................................................. නම් වේ.

35. බහුවිධ බුද්ධි න්‍යාය හඳුන්වා දුන් ඇමරිකානු ජාතික ...................................... නම් මනෝ විද්‍යාඥයාගේ න්‍යායට අනුව ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය ඇති වීමට .......................................... බුද්ධිය හේතු වේ.

36. ''ජග් ජිත් සිං'' නම් උත්තර භාරතීය ගායන ශිල්පියා ...................................... ගායන ශෛලියට ප්‍රසිද්ධ වන අතර ''රඝුපති රාගව'' ගීතය .......................................... ගායන ශෛලියට අයත් වේ.

37. තත් භාණ්ඩ අතුරින් ''ජවාරි'' සැකසීම ....................... හි දක්නට ඇති අතර ''මෛදාන්'' නැමති කොටස පිහිටා ඇත්තේ ........................................................... වෙහි ය.

38. මෙරට ප්‍රථම වර්ණ චිත්‍රපටය වූ .................................. චිත්‍රපටය .................................... ශූරීන්ගේ සංගීත නිර්මාණයෙන් රසවත් වී ඇත.

39. ''ව්‍යංකට මුඛී'' නම් සංගීතඥයා විසින් හඳුන්වා දුන් කර්ණාඨක මේල ගණන ..................................... ක් වන අතර හිනදුස්ථානි සංගීත පද්ධතියේ රාග නිර්මාණයට පදනම් වී ඇති මේල (ථාය) ගණන ......................................................... කි.

40. C $^{m}$*minor* ස්කේලය ............................ ලෙස බටහිර ස්වර වලින් ලියා දක්වන අතර එය හින්දුස්ථානි සංගීතයේ ............................... මේලයේ ස්වර වලට සමාන වේ.

- **අංක 41 සිට 45 තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය තුළ දැක්වෙන හිස්තැන්වලට අදාල පිළිතුර යොදා පුරවන්න.**

හින්දුස්ථානි සංගීතයේ ආරම්භය වේද ගායනා ආශ්‍රයෙන් ආරම්භ වූවා යැයි පිළිගැනෙන අතර, එයින් සංගීතය හා සම්බන්ධ වේදය 41 ........................................................ වේ. වේද ගායනා නාදස්ථාන තුනක් වූ උදාත්ත 42 ................................................ සහ 43 ........................................................ මත ගායනා වී ඇත. වර්තමාන ඉන්දියානු සංගීත අධ්‍යාපනය විධිමත් කළ 44 ..................................................................... පණ්ඩිතුමා විසින් 45 ......................................................... නම් ග්‍රන්ථය රචනා කර ඇත.

46. ''සිනිඳු සුදු මුදු තලාවේ'' ගීතය ...................................... චිත්‍රපටයේ එන ගීතයක් වන අතර එම ගීතය .......................................... තාල්. මත නිර්මාණය වී ඇත.

47. පැස්ටොරල් (*Pastoral*) *No:06* සිම්ෆනිය ..................................... සංගීතඥයාගේ වන අතර ජුපිටර් (JUPITER) *No:41* ..................................... සංගීතඥයාගේ කෘතියකි.

48. බටහිර සංගීත ස්වර ප්‍රස්ථාර කරණයේදී (*PP*) ලෙස යොදන සංකේතය ................................. නමින් හඳුන්වන අතර (𝄋) මෙම සංකේතය ..................................... නමින් හඳුන්වයි.

49. ''ස'' ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් 256 ක් වන්නේ නම් මධ්‍ය ගාන්ධරයේ සංඛ්‍යාතය හර්ට්ස් .................................... වන අතර ''ප'' ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් ..................................... ක් වේ.

50. භාරතීය සංගීතය ...................................... යුගය, හින්දු යුගය ......................................යුගය සහ නූතන යුගය ලෙස යුග හතරකි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**

**Third Term Test - Grade 13 - 2023**

# සංගීතය (පෙරදිග) - II

කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

- I කොටසින් ප්‍රශ්න දෙකකට ද, II කොටසින් ප්‍රශ්න එකකට ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදි වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

## I කොටස

(01) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කිහිපයකි.

A - ස රි නි ධ ස , රි ම ප ධ , ම ප ග රි ස

B - ස, ග, ම, ධ, ප, ම, ග, (ම), රි, ස

C - සරිස , නිස රිමප , මපධ මගරි

D - ධ නි ස ග ම , ම ග මග රිස

(i) ඉහත රාග හතර හඳුනා ගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග රාගයේ නම ලියන්න. (ල. 04)

(ii) ඉහත රාග අතුරෙන් රිෂභය හා පංචමය වාදී සංවාදී වන රාගය නම් කර ඊට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්ථාර කර මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ල. 08)

(iii) ඉහත රාග අතුරෙන් කාෆි මේලයට අයත් රාගය නම්කර ඊට අදාළ ස්වර පල්ටාවක් (රාගාශ්‍රිත ස්වර අභ්‍යාසයක්) උච්ච සඩ්ජය දක්වා ගොඩ නගන්න. (ල. 04)

(iv) ''තිරිකිට'' යන තාලාක්ෂරය දෙවරක් බැගින් යෙදෙන නිර්දේශිත තාලයක් නම් කර, එම තාලය නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 04)

(02) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් විශේෂ ලක්ෂණ කිහිපයකි.

A ඖඩව - සම්පූර්ණ ජාති රාගයක් වන මෙම රාගයේ ගාන සමය දිවා දෙවන ප්‍රහරයයි

B සඩ්ජය හා පංචමය වාදී සංවාදී වන මෙම රාගය රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයීමට සුදුසු වේ

C පරමේල ප්‍රවේශක රාගයක් ලෙසින් හඳුන්වන මෙම රාගයේ රිගුරිස නිධප රි යන ස්වර සංගතියේ යෙදේ.

(i) ඉහත රාග තුන හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග ලියා දක්වන්න. (ල. 03)

(ii) ඉහත A සහ B යන රාග අතුරෙන් කැමති එක් රාගයක් නම් කර ඊට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස නියමිත තාල සංකේත සහිතව ස්වර ප්‍රස්ථාර කර, මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න. (ල. 09)

(iii) ආවර්ථයකට හිමි මාත්‍රා සංඛ්‍යාව සමාන වුව ද එක් එක් විභාගය තුළ යෙදෙන මාත්‍රා සංඛ්‍යා අසමාන වන අවස්ථාවද ඇති නිර්දේශිත තාල දෙකක් නම් කරන්න. (ල. 04)

(iv) ඉහත ඔබ නම් කළ තාල දෙකෙන් කැමති එත් තාලයක් සමගුණ හා දෙගුණ වශයෙන් තාල සංකේත සහිතව ප්‍රස්තාර කර දක්වන්න. (ල. 04)

(03) පහත දක්වා ඇත්තේ නිර්දේශිත රාග දෙකකට අදාළව නිර්දේශිත තාල දෙකක එක් ආවර්ථයක් සම්පූර්ණ වන සේ නිර්මාණය කළ ස්වර ප්‍රස්ථාර දෙකකි.

A- | ස - ධ නි රිග | රිරි ස | නි නි ධ | ප රි ග රිස |

B- | ග - | රි රි | නි ප | ස - | නි සං | නි ප |

(i) ඉහත ස්වර ප්‍රස්ථාර දෙකට අදාළ රාග හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න. (ල. 02)

(ii) ඉහත A සහ B ස්වර ප්‍රස්ථාර සඳහා පදනම් කරගත් නිර්දේශිත තාල දෙක අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියන්න. (ල. 02)

(iii) ඉහත ඔබ නම් කළ A සහ B තාල දෙක පදනම්ව විලම්භ ලයෙන් යුතුව ගායනය කරනු ලබන නිර්දේශිත ශාස්ත්‍රීය ගායන ශෛලීන් දෙක නම් කර, එම ගායන ශෛලීන් දෙකෙහි සම විෂමතා 03ක් සංසන්දනාත්මකව ලියා දක්වන්න. (ල. 08)

(iv) තානාලංකාර වර්ග දෙකක් නම් කර ඉහත A සහ B රාග දෙකින එකකට අදාළව මාත්‍රා 08 කට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න. (ල. 04)

(v) ආලාප වර්ග දෙකක් නම් කර කැමති නිර්දේශිත ආගයකට අදාළව ස්වර 20 කට නොඅඩු ආලාප ස්වර ලියා දක්වන්න. (ල. 04)

## III කොටස

(04) (i) පහත සඳහන් ගී වර්ග යුගල වලින් දෙකක් තෝරා ගෙන එම එක් එක් යුගලයෙහි ඇතුළත් ගී වර්ග දෙක කරුණු 04 යටතේ වෙන වෙනම සංසන්දන කර දක්වන්න.

* බඹර ගී - පැල් ගී
* ප්‍රශස්ති ගී - හටන් ගී
* වැදි ගී - ටීකා සීපද
* නෙළුම් ගී - කමත් ගී (ල. 08)

(ii) වැලපුම් ගීත පිළිබඳව එහි භාෂාව, නාදමාලාව සහ රිද්මය යන කරුණු ඇසුරෙන් කෙටියෙන් හඳුන්වන්න. (ල. 06)

(iii) සැවුලා වන්නමෙහි තානම කොටස නියමිත තිත් රූපයට අනුව ගීත (පද) ප්‍රස්ථාර කරන්න. (ල. 06)

(05) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග සම්ප්‍රදායන් තුනකට අයත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

* මද්දල දෙකකින් අඩුතාල හා වැඩිතාල වාදනය කෙරේ.
* ගීතනු රටා උඩරට ශාන්තිකර්ම වල එන ගායනා හා සම්බන්ධ වේ.
* ''සීතා මා සිරියා ඉන්නේ'' යන ගීතය මෙම සම්ප්‍රදායට අයත් ගීතයකි.
* අලගනායිඩු නම් සංගීතඥයා සුවිශේෂ දායකත්වයක් ලබා දී ඇත.
* චරිත සඳහා කොළපත් වලින් තැනූ වෙස්මුහුණු භාවිත කරයි.
* ''විශ්වනාත් ලව්ජි'' නම් සංගීතඥයා ගීතනු නිර්මාණයට දායක වී ඇත.

(i) ඉහත තොරතුරු වලට අදාළ රංග සම්ප්‍රදායන් තුන නම් කර එක් එක් සම්ප්‍රදායට අයත් තොරතුරු ඒ යටතේ ලියා දක්වන්න. (ල. 09)

(ii) ඉහත රංග සම්ප්‍රදායන් තුනෙන් ඔබ කැමති දෙකක් නම් කර, ඒවායෙහි සංගීතමය ලක්ෂණ තුනක් පිළිබඳව සංසන්දනාත්මකව ලියා දක්වන්න. (ල. 06)

(iii) මහනුවර යුගයේදී ශ්‍රී ලංකාවේ සංගීත විකාශය කෙරෙහි කර්ණාටක සංගීතයෙන් සිදු වූ බලපෑම පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 05)

(06) පහත දී ඇති බටහිර සංගීත ප්‍රස්ථාරය ඇසුරින් පිළිතුරු සපයන්න.




(i) a) ඉහත අපරදිග ස්වර ප්‍රස්ථාරය අයත් ස්කේලය (*Scale*) නම් කරන්න. (ල. 02)

b) එම ස්කේලයට අයත් ස්වර පිළිවෙලින් ලියන්න. (ල. 02)

(ii) ඉහත අපරදිග ස්වර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්ථාර කරන්න. (ල. 08)

(iii) ඉහත ප්‍රස්ථාරයේ 1 සිට 5 දක්වා සලකුණු කර ඇති සංකේත පහෙන් කැමති 04 ක් නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ල. 08)

(07) (i) පහත වගුවෙහි (i) සිට (viii) දක්වා එක් එක් හිස්තැනට සුදුසු පිළිතුර අදාළ අංකය ද සමඟ ලියා දක්වන්න.

| සංගීත අධ්‍යක්ෂකවරයා | චිත්‍රපටය | ගීතය |
|---|---|---|
| සංගීතය - B.S. පෙරේරා<br>ගී තනු - සුනිල් ශාන්ත | (i) ........................................ | ඕලු නෙළුම් නෙරිය රඟාලා |
| (ii) ........................................ | (iii) ........................................ | සිනිඳු සුදු මුදු තලාවේ |
| (iv) ........................................ | මාතලන් | (iv) ........................................ |
| W.D. අමරදේව | (vi) ........................................ | ගලන ගඟකි ජීවිතේ |
| (vii) ........................................ | බඹරු ඇවිත් | උදුම්බරා |
| (viii) ........................................ | කඩවුණු පොරොන්දුව | සන්ධ්‍යාවේ ශ්‍රීය රම්‍යා |

1×8 (ල. 08)

(ii) ''රේඛාව'' සිංහල චිත්‍රපටය ලාංකීය චිත්‍රපට සංගීත ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. උදාහරණ සපයමින් විමසුමක යෙදෙන්න. (ල. 06)

(iii) සිංහල බසින් රචිත ඔබ කැමති ඕනෑම සරල ශාස්ත්‍රීය ගීතයක් නම් කර එහි ඇතුළත් ශාස්ත්‍රිය ලක්ෂණ පිළිබඳ උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල. 06)

(08) පහත සඳහන් කොටස් අතුරෙන් හතරක් තෝරා පිළිතුරු සපයන්න.

(i) ඔබ කැමති ස්වර වාද්‍ය භාණ්ඩයක දළ සටහනක් ඇඳ කොටස් 04ක් නම් කර, ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය ලකුණු කර දක්වන්න.

(ii) ''ස්වරාලය'' සහ ''කර්ණේන්ද්‍රය'' යන ඉන්ද්‍රියයන් ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම සංගීතය හදාරණ අයකුට වැදගත් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iii) සිතාරය සහ එස්රාජය පිළිබඳව පහත කරුණු ඇසුරෙන් සංසන්දනයක් කරන්න.
 * නාද උත්පාදක ක්‍රම.
 * වාදන ඉරියව්.
 * තත් සංඛ්‍යාව සහ සුසර කරන ආකාරය.

(iv) උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධතීන්හි සම විෂමතා පහක් ලියන්න.

(v) සංධ්වනියක විශේෂ ලක්ෂණ 04 ක් සහ අපරදිග සංධ්වනි නිර්මාණකරුවන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(vi) සංගීත විෂයය හා සම්බන්ධ නිර්මාණ සහ විවිධ ක්‍රියා කාරකම්වලදී පරිගණකය භාවිතය තුළින් සිදු වූ වර්ධනීය අවස්ථා පිළිබඳ ඔබගේ අදහස් කෙටියෙන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 5×4 -20)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(2) | 3 -(4) | 4 -(5) | 5 -(2) | 6 -(4) | 7 -(2) | 8 -(2) | 9 -(4) | 10 -(2) |
| 11 -(5) | 12 -(3) | 13 -(5) | 14 -(3) | 15 -(1) | 16 -(4) | 17 -(3) | 18 -(4) | 19 -(3) | 20 -(3) |
| 21 -(3) | 22 -(2) | 23 -(2) | 24 -(5) | 25 -(3) | 26 -(2) | 27 -(5) | 28 -(2) | 29 -(3) | 30 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

(31) ගැමිලැන් / මැදපෙරදිග
(32) සී ද එස් කුලතිලක / ඩබ්.බී. මකුලොලුව
(33) නාඩගම් / නූර්ති
(34) ලොස්කැබ්ලරොස් / නෙවිල් ප්‍රනාන්දු
(35) නෝවාර්ඩ් ගාඩ්නර්/සංගීතය-රිද්මවානුකූල බුද්ධිය
(36) ගසල් / භජන්
(37) සිතාර් / තබ්ලාවේ
(38) රන්මුතු දූව /පණ්ඩිත් අමරදේව
(39) 72 / 110
(40) *C D $E^b$ F G $A^b$ $B^b$ C* / ආශාවරී
(41) සාම වේදය
(43) අනුදාත්ත
(43) ස්වරිත
(44) භාත්ඛණ්ඩේ පඬිතුමා
(45) ක්‍රමික පුස්තක මාලිකා
(46) සත්සමුදුර / ත්‍රිතාල් හා දීප්චන්දි තාලය
(47) ලුඩ්විග් වෑන් / බීතෝවන් / අමදියෙස් මෝසාම්
(48) *Very soft / sign to sign*
(49) *$H_2$320 / 384 H*
(50) වෛදික යුගය / මෝගල් යුගය

## පිළිතුරු පත්‍රය - II කොටස

(01) (i) A. ආශාවරී රාගය B. භෛරව රාගය C. දේස් රාගය D. භාගේශ්‍රී රාගය (ල. 04)
(ii) දේස් රාගය ලෙස නම් කල යුතුයි
දේස් රාගයට අදාළව ස්වර ප්‍රස්ථාරයට (ල. 04)
තානාලංකාර 02 (ල. 04)
(iii) භාගේශ්‍රී රාගය අදාල රාගාශ්‍රිත පල්ටාවකට (ල. 04)
(iv) ඒක් තාලය හෝ තිලවඩා තාලය ලෙස නම් කිරීමට (ල. 01)
ඉහත තාල දෙකෙන් එකක් ප්‍රස්තාර කිරීමට (ල. 02)
නියමිත තාල සංඥා යෙදීමට (ල. 01) (මුඃ ල. 20)

(02) (i) A. ආශාවරී B. හංසධ්වනී C. ජයජයවන්ති රාග නම් කිරීමට (ල. 03)
(ii) ආශාවරී හෝ හංසධ්වනී රාග දෙකෙන් එකකට අයත් ස්වර ප්‍රස්ථාරයට
රාගය නම් කිරීමට (ල. 01) / ස්ථායි කොටසට (ල. 04) / තානාලංකාර 02 (ල. 04) (මුඃල. 09)
(iii) දීප්චන්දි තාලය / ධමාර් තාලය නම් කිරීමට (ල. 04)
(iv) ඉහත තාල දෙකෙන් එකක් සමගුණ සහ දෙගුණ ලෙස ප්‍රස්තාර කිරීමට (ල. 04) (මුඃ ල. 20)

(03) (i) A. ජයජයවන්ති රාගය B. හංසධ්වනි රාගය (ල. 02)
(ii) A. ධමාර් තාලය B. ඒක් තාලය (ල. 02)
(iii) ධමාර් සහ ධමාර් ලෙස නම් කිරීමට (ල. 02)
සම විෂමතා තුනක් සංසන්දනයට (ල. 06)
(iv) * ශුද්ධ තාන, කූට තාන, බෝල් තාන, තමන් තාන, අලංකාරික තාන ආදි වශයෙන් 2ක් නම් කිරීමට (ල. 02)
* රාග දෙකින් එකකට අයත් නිවැරදි තානාලංකාර දෙකක් ලිවීමට (ල. 02)
(v) * තෝම් තෝම් ආලාප, ආකාර් ආලාප, ස්ථායි ආලාප ආදී වශයෙන් 2ක් නම් කිරීමට (ල. 02)
* රාග දෙකින් එකකට අයත් නිවැරදි ආලාප කොටසට (ල. 02) (මුඃ ල. 20)

(04) (i) දෙකක් නිවැරදිව සංසන්දනයට 4×2 (ල. 08)
(ii) වැලපුම් ගී පිළිබඳ නිවැරදි කරුණු දැක්වීමට (ල. 06)
(iii)

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | ම් | ත | ම් | දෙ | න | තෙ | s | නාං | ss | s | ම් |
| දෙ | න | ත | ම් | දෙ | න | තා | s | නා | s | s | ම් |
| ත | ම් | ත | ම් | දෙ | න | තා | s | නා | s | තෙ | යි |
| ත | ම් | ද | s | s | s | ss | ss | s | s | s | s |
| s | s | නා | s | ත | ම් | දෙ | s | නා | s | s | s |
| නාs | s | s | s | s | s | s | s | s | s | s | s |

පේළි 06 නිවැරදි ලෙස ප්‍රස්ථාර කිරීමට (ල. 06) (මුඃ ල. 20)

(05) (i) <u>නාඩගම්</u>
මද්දල් දෙකකින් අඩුතාල ..........
විශ්වනාත් ලෞජි ..........

<u>නූර්ති</u>
සීත මා සිරියා ..........
චරිත සඳහා කොළපත් .......... නම් කිරීමට

<u>සොකරි</u>
ගී තනු රටා ..........
චරිත සඳහා කොළපත් .......... නම් කිරීමට (ල. 03) (මුඃ ල. 20)

(ii) රංග සම්ප්‍රදායන් දෙකක සංගීත ලක්ෂණ සංසන්දනය කිරීමට (ල. 06)
(iii) නිවැරදි කරුණු ඇතුළත් විස්තරයට (ල. 05)

(06) (i) *a* - *C minor Scale* ලෙස නම් කිරීමට (ල. 02)
*b* - ස රි ග ම ප ධ නි ස්
$C\ D\ E^{b}\ F\ G\ A\ B^{b}\ C^{b}$ ලෙස ලිවීමට (ල. 02)

(ii) | + සප ප - | - - ධ ප | ම ධධ පම | ග රිරි ස නි |
| + + රි ග | ම රි ග රි | ස - - - | - - ප ධ | නිවැරදි ලෙස ප්‍රස්ථාර කිරීමට (ල. 08)

(iii) (1) *Key signature* / කී සිග්නේචර්
(2) *Tim signature* / ටයිම් සිග්නේචර්
(3) *Crotchet Rest Mark* / ක්‍රොචඩ් රෙස්ට් මාර්ක්
(4) *Tie* / ටයි
(5) *Minim Rest Mark* / මිනිම් රෙස්ට් මාර්ක්
ලෙස නම් කිරීමට සහ විස්තර කිරීමට (ලකුණු 2×4 -08) (මුලු ලකුණු 20)

(07) (i) (1) රේබාව
(2) සෝමදාස ඇල්විටිගල
(3) සත්සමුදුර
(4) ආර්. මුත්තුසාමි
(5) කොවුලන් හඬයි සහ වෙනත්
(6) රන්මුතුදූව
(7) ප්‍රේමසිරි කේමදාස
(8) ආර්. නාරායන් (ලකුණු 1×8 -08)

(ii) රේබාව චිත්‍රපටය පිළිබඳ නිවැරදි විස්තරයට (ල. 06)
(iii) සරල ශාස්ත්‍රිය ගීතයක් ඇසුරින් විස්තර කිරීමට (ල. 06)
(මුලු ලකුණු 20)

(08) (i), (ii), (iii), (iv), (v), (vi) යන කොටස් හයෙන් හතරක් පිළිබඳව නිවැරදිව කරුණු ලිවීමට 5×4
(මුලු ලකුණු 20)